# මාර්ගගත ගෙවීම සඳහා පියවර

1. කරුණාකර අවශ්‍ය විස්තර නිවැරදිව පුරවන්න.

   a. **"Faculty/Unit/Center"** තෝරන්න. උදා: Distance and Continuing Education Unit
   b. **"Programme information"** තෝරන්න. උදා: Bachelor of Arts External Degree
   c. **"Payment Category"** තෝරන්න. උදා: Examination Fee
   d. **NIC, Email, First Name, Last Name** පුරවන්න. (කරුණාකර නිවැරදිව විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළත් කරන්න. එය ඔබට ගෙවීම් සනාථ කර එවීම සඳහා භාවිතා කරනු ඇත.)
   e. පසුව, ඔබගේ ශිෂ්‍ය කණ්ඩායම් අංකය (Batch Number), " **Enter Your Batch Number** " හි සඳහන් කරන්න.
   f. ඉන්පසු "LKR" ලෙස මුදල් වර්ගය තෝරන්න.
   g. පසුව ගෙවීම් මුදල සඳහන් කරන්න. උදා: 2000
   h. පසුව " **CAPTCHA** " හි සඳහන් අක්ෂර 06 කින් යුතු වචනය සඳහන් කර **Submit**" මත ක්ලික් කර ඉදිරි පියවර වෙත පිවිසිය හැක.




2. පසුව ඔබ පුරවන ලද තොරතුරු තහවුරු කළ යුතුය.



මෙහි තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගෙවීම් ඉදිරියට සිදුකිරීම සඳහා **OTP** ලබා දියයුතුය. මෙය ඔබ ලබාදුන් ඊමේල් ලිපිනය වෙත ඊමේල් පණිවුඩයක් සේ ලබාදෙනු ලැබේ. එය අංක 06 කින් සමන්විත වන අතර එයලබාදී "**Validate**" මත **Click** කිරීමෙන් එය තහවුරු කල හැක. එවිට එය කොළ පැහැයෙන් "**OTP is Valid**" ලෙස දිස්වනු ඇත.




එවිට ඔබට පහත 3 පියවර වෙත "**Confirm**" මත Click කිරීමෙන් පිවිසිය හැක. සැ.යු. මෙය තහවුරු කිරීම විනාඩි 03 ඇතලත සිදු කලයුතුය. එසේ නැතිනම් මෙය අවලංගු වනු ඇත.

**LKR වලින් කරන ලද ගෙවීම් සඳහා 1% සේවා ගාස්තුවක් අය කරනු ලබන අතර USD වලින් කරනු ලබන ගෙවීම් සඳහා 2.5% සේවා ගාස්තුවක් අය කරන බව කරුණාවෙන් සලකන්න.**

3. විස්තර පරීක්ෂා කිරීමෙන් අනතුරුව " **confirm** " මත ක්ලික් කරන්න, එවිට ඔබ ගෙවීම් පිවිසුම වෙත පිවිසෙනු ඇත.
    a. මෙහිදී ඔබගේ ගෙවීම් කාඩ්පත් විස්තර පිරවිය යුතුය. පහත රූපයේ දැක්වෙන්නේ තොරතුරු මඟින් කාඩ්පතෙහි විස්තර හඳුනා ගත හැක.




පහත රූපයේ දැක්වෙන්නේ ඔබේ මාර්ගගත ගෙවීම සිදු කිරීම සඳහා කාඩ්පතෙහි තොරතුරු ඇතුළත් කිරීමට ඇති අතුරුමුහුණතයි.

    b. ගෙවීම් කාඩ්පත් වර්ගය " **Visa**" හෝ " **Master Card**" වේ.(පහත රූපයේ දැක්වෙන ලාංඡනය ඔබගේ කාඩ්පතෙහි හඳුනාගත හැක. එයින් ඔබට කාඩ්පත් වර්ගය හඳුනාගත හැක).
    c. පසුව "**card number**" ඇතුළත් කරන්න. ඉහත රූපයේ පරිදි ඔබගේ කාඩ්පතෙහි අංක 16ක් සහිත අංකය හඳුනාගෙත හැකිය.
    d. පසුව "**Expiration Date**"ඇතුළත් කරන්න.
    e. ඉන්පසුව "**Card Verification Number (CVN )**" ටයිප් කරන්න. එය කාඩ්පතෙහි පිටුපස සඳහන් අංක 03 කින් හෝ 04 කින් සමන්විත අංකයකි.




f. විස්තර පිරවීමෙන් පසු, " **Pay** " මත ක්ලික් කිරීමෙන් ඔබට ගෙවීම ඉදිරියට ගෙන යා හැක.

4. එවිට ඔබව **OTP (One-Time Password)** ඉල්ලීම් පිටුවකට යොමු කරනු ඇත. එහිදී OTP එක ඔබගේ ජංගම දුරකථනයට හෝ විද්‍යුත් තැපෑලට යවනු ලැබේ. එය ඔබගේ බැංකුව මත රඳා පවතින අතර එම සේවාව සක්‍රිය කර ඇත්නම් පමණක් **OTP** ඔබට ලැබෙනු ඇත. එසේ 5 වන පියවර හා සම්බන්ධ වේ. තවද මෙම අතුරු මුහුණත ඔබගේ බැංකුව සහ කාඩ්පත අනුව වෙනස් විය හැක.




5. **OTP** සාර්ථකව යොමු කිරීමෙන් පසු ඔබ නැවත pay.ruh.ac.lk වෙත යොමු කෙරෙනු ලැබේ. (පහත රූපයේ ආකාරයෙන් දිස්වනු ලැබේ.)
   a. ගෙවීම සාර්ථක නම්, ඔබට පහත පරිදි " **Payment Successful**" ලෙස දන්වනු ඇත.
   b. ඔබට " **Download Transcript Receipt** " භාවිතයෙන් ගෙවීම් කුවිතාන්සිය බාගත කළ හැකිය.




**පහත වෙබ් පිටුව සම්පූර්ණ වී විනාඩියකට පසු ඔබව මුල් වෙබ් පිටුව වෙත හරවා යවනු ලබන බව කරුණාවෙන් සලකන්න. කාලය අවසන් වීමට පෙර ඔබ රිසිට්පත බාගත කළ යුතුය.**







c. තවද, ඔබ ඔබේ විද්‍යුත් තැපැල නිවැරදිව ලබා දෙන්නේ නම්, ඔබට පහත දැක්වෙන පරිදි ගෙවීම් තහවුරුවක් විද්‍යුත් තැපැල හරහා ලැබෙනු ඇත.




6. 4 හා 5 වන පියවර සම්පූර්ණ නොවේ නම්, ඔබට පහත පරිදි " **Payment Failed**" ලෙස පෙන්වනු ඇත. මෙමගින් ගෙවීම අසාර්ථකය ලෙස දැනුම් දෙනු ලබන අතර ඒ සඳහා පහත හේතූන් ද බලපානු ඇත.

(1) අන්තර්ජාල සේවා බිඳවැටීම්
(2) කාඩ්පතෙහි මුදල් නැතිවීම
(3) වැරදි කාඩ්පත් තොරතුරු ඇතුළත් කිරීම

Pay Online
University of Ruhuna

Welcome to the University of Ruhuna online payment gateway. This secure and efficient platform is designed to streamline your payment process, making it easy for you to manage fees related to administration and educational expenses

© 2024 Ruhuna University Centre for IT

## 3. Payment Status

### Payment Failed

Your transaction has been declined. Please contact your bank for further details or, to proceed with the payment, you can pay with a different card or try again!
Details of the transaction are included below

TRANSACTION NUMBER : 4070124132950436bf87
TRANSACTION AMOUNT : LKR 10.10

TRANSACTION DATE : 2024-08-13

You will be redirected after 00:58. OR Click here to redirect to HOME